සැ. යු. - (i) 2021.10.15 දින පළ වූ අංක 2,250 දරන *ගැසට් පත්‍රයේ* IV (අ) කොටස පළ නොවීය.
(ii) මෙවර පළවන *ගැසට් පත්‍රයේ* VI කොටසේ 2021 වර්ෂය සඳහා කෑගල්ල දිස්ත්‍රික්කයට අයත් අධිකරණ කලාපවල ජූරි සභිකයින්ගේ නාමාවලියක් සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි භාෂාවන්ගෙන් පළ වේ.

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අංක 2,251 - 2021 ඔක්තෝබර් මස 22 වැනි සිකුරාදා - 2021.10.22**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී.)

## II කොටස – අධිකරණ

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙන පිටු අංක යොදා ඇත.)

| | පිටුව |
|---|---|
| සම්මත වූ පනත් ... ... ... ... | — |
| පනත් කෙටුම්පත් ... ... ... ... | — |
| ශ්‍රේෂ්ඨාධිකරණයේ දැන්වීම් ... ... ... ... | — |
| ශ්‍රී ලංකා ඇපැල් උසාවියේ දැන්වීම් ... ... ... | — |
| ශ්‍රේෂ්ඨාධිකරණයේ අපරාධ නඩු සැසි පිළිබඳ නිවේදන ... | — |
| දිසා අධිකරණ හා මහෙස්ත්‍රාත් අධිකරණ දැන්වීම් ... | — |
| වස්තු භංගත්ව නඩු පිළිබඳ දැන්වීම් ... ... ... | — |
| පිස්කල් මාර්ෂල්වරුන්ගේ පත් කිරීම් ... ... ... | — |
| පිස්කල් විකිණීම ... ... ... | 562 |
| මුදල් නඩු පිළිබඳ දැන්වීම් ... ... ... | — |
| නීති අධ්‍යාපන සභාවේ දැන්වීම් ... ... ... | — |
| නොතාරිස් ලැයිස්තු ... ... ... ... | — |
| විවිධ දැන්වීම් ... ... ... ... | 564 |

සැ. යු.- (i) සිවිල් නඩු විධාන සංග්‍රහය (සංශෝධන) පනත් කෙටුම්පත, 2021 ඔක්තෝබර් මස 01 වැනි දින *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ* II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළකරන ලදී.
(ii) විසර්ජන (සංශෝධන) පනත් කෙටුම්පත, 2021 ඔක්තෝබර් මස 01 වැනි දින *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ* II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළකරන ලදී.
(iii) සහන ප්‍රජා සංවර්ධන පදනම (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත, 2021 ඔක්තෝබර් මස 01 වැනි දින *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ* II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළකරන ලදී.

**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

**වැදගත් නිවේදනයයි**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළකරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාලවේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනට සති දෙකකට පෙර (එනම්, 2021 නොවැම්බර් මස 12 වැනි දින පළකරන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2021 ඔක්තෝබර් මස 29 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර) තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගණුදෙනු පනත - 9 වැනි වගන්තිය**

**"යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් *ගැසට් පත්‍රයේ* පළකළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන *ගැසට් පත්‍රයක* පළ කරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැළකිය යුතු ය."**

ගංගානි ලියනගේ,
රජයේ මුද්‍රණාලයාධිපති.

2021 ජනවාරි මස 01 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

මෙම *ගැසට් පත්‍රය www.documents.gov.lk* වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

# පිස්කල් විකිණීම්

## පිස්කල් වෙන්දේසියේ විකිණීමේ දැන්වීමයි

කොළඹ දී පවත්වනු ලබන බස්නාහිර පළාතේ වාණිජ මහාධිකරණයේ දී ය

එච්. එන්. බී. ග්‍රාමීන් ෆිනෑන්ස් ලිමිටඩ්,
අංක 168, නාවල පාර,
නුගේගොඩ.

..................*පැමිණිලිකරු.*

*නඩු අංකය* : HC/CIVIL/430/2017/MR

*එදිරිව*

තෙලිකඩ නානායක්කාරවසම් මොරොන්තුඩුවගේ
තනූජා දමයන්ති නානායක්කාර,
අංක 526/A/1,
හයිලෙවල් පාර,
පන්නිපිටිය.

*සහ*

අංක 2841/1, අටවන පටුමග, බංගලාවත්ත,

*සහ*

අංක 478, අරංගල, හෝකන්දර දකුණ,
හෝකන්දර.

....................*විත්තිකාරිය.*

ඉහත නම් සඳහන් විත්තිකාරිය වෙත ය.

මෙම නඩුවෙහි වර්ෂ 2019 ක් වූ මැයි මස 27 වන දින පැමිණිල්ලේ වාසියට හා විත්තිකාරියට විරුද්ධව ලබාදෙන ඒකපාර්ශ්වික තීන්දුව ප්‍රකාරව,

විත්තිකාරිය විසින් රුපියල් අනූ හතර ලක්ෂ දහතුන් දහස් අටසිය තුනයි ශත පනස් නවය (රු.9,413,803.59) ක මුදල සහ නඩු තීන්දුවේ දින සිට නෛතික පොළිය පමණක් අයකර ගැනීමට ද ඉහත කී මුදල් අයකර ගැනීම සඳහා මෙහි උපලේඛනයේ විස්තර කර ඇති ඉඩම් කැබැල්ල සහ පරිශ්‍රය ඒ මත පිහිටි සහ මින් මතුවට ඉදිකරනු ලබන ගොඩනැගිලි ද සමග සහ ඒ මත ඇති හෝ ඊට අයත් සියලුම සවි කිරීම් සහ උපකරණ සහ ඒ තුළ හෝ ඒ මතින් විත්තිකරුවන්ට ඇති කවරාකාරයක හෝ වත්කම්, අයිතිවාසිකම්, හිමිකම්, බැඳීම් දේපළ, හිමිකම්පෑම් සහ ඉල්ලීම් ද සමග බැඳී තිබේ සහ ක්‍රියාත්මක කළ හැකි බවට තීන්දු ප්‍රකාශ කර ඇති හෙයින් ද,

ඉහත කී මුදල් තීන්දු කරන ලද පරිදි පොළී සහ ගාස්තු ද සමග තීන්දු ප්‍රකාශයේ දින සිට මාස දෙකක් ඇතුළත ගෙවීම් පැහැර හැරියහොත් එම වෙන්දේසිය නියම කිරීමේදී සහ ඊට බලය ලබාදීමේ දී අධිකරණය විසින් දක්වනු ඇති විකුණුම් කොන්දේසි මත එම ස්ථානයේ දී අධිකරණය විසින් පත්කරනු ලබන බලයලත් වෙන්දේසිකරුවකු මගින් පොදු වෙන්දේසියේ විකිණීම සඳහා මෙහි උපලේඛනයේ විස්තර කර ඇති උකස් කරන ලද පරිශ්‍රය බැඳී ඇති බවට සහ ක්‍රියාත්මක කළ හැකි බවට තීන්දු ප්‍රකාශ කර ඇති හෙයින්,

එලෙස තීන්දු කරන ලද ඒකපාර්ශවික තීන්දුව ප්‍රකාරව, විත්තිකාරිය විසින් ගෙවීම් පැහැර ඇති බැවින්, එකී මුදල් අයකර දීම සඳහා කොළඹ, වාණිජ මහාධිකරණයේ ඉහත අංක දරන නඩුවෙන් මා වෙත නිකුත් කර ඇති විකිණීමේ ආඥාව ප්‍රකාරව මෙහි පහත උපලේඛනයේ විස්තර කොට ඇති ඉඩම සහ ඒ මත පිහිටි ගොඩනැගිලි ගහකොළ ආදී සියලු ද්,

වර්ෂ 2021 ක් වූ නොවැම්බර් මස 12 වැනි දින පෙ. ව. 11.00 ට එකී දේපළ පිහිටා ඇති පන්නිපිටිය, රුක්මලේ, අරලිය මාවත, අංක 167/B දරන ස්ථානයේ දී මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබන බව මෙයින් ප්‍රසිද්ධ කොට ප්‍රකාශ කරනු ලැබේ.

වෙන්දේසියේ දී ඉහළම ලංසු තබන්නා ගැනුම්කරු වන අතර, වෙන්දේසිය අවසන් වූ වහාම ගැනුම්කරු විසින්,

1. මුළු ගැනුම් මිලෙන් 25% ක මුදලක් ද,
2. වෙන්දේසි ගාස්තු හා රජයේ ගාස්තු ද,

විකිණීම අවසන් වූ වහාම මුදලින් මා වෙත (වෙන්දේසිකරු) ගෙවිය යුතුය. චෙක්පත් භාරගනු නොලැබේ. ගැනුම් මිලෙන් ගෙවන ලද්දේ 25% ක මුදලක් පමණක් නම්, ගැනුම් මිලෙන් ඉතිරි මුදල වන 75% ක මුදල දින 30 ක් ඇතුළත කොළඹ, වාණිජ මහාධිකරණයේ ඉහත අංක දරන නඩුවට තැන්පත් කළ යුතුය.

උපලේඛනය

බස්නාහිර පළාතේ කොළඹ දිස්ත්‍රික්කයේ හේවාගම් කෝරළේ පල්ලේ පත්තුවේ මහරගම නගර සභා සීමාව තුළ සහ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ අංක 497 රුක්මලේ බටහිර ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ රුක්මලේ යන ගමේ පිහිටි දෙල්ගහවත්ත නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු ඩී. එස්. එස්. කුරුප්පු විසින් 1994.09.20 වන දින මැන සකස් කරන ලද අංක 2885A දරන පිඹුරේ ලොට් අංක A දරන කොටසට මායිම් උතුරට : ආර්. ඒ. ඩී. කරෝලිස් අප්පුහාමිගේ උරුමකරුවන් හිමිකම් කියන දෙල්ගහවත්ත ද නැගෙනහිරට : පිඹුරු අංක 1171 හි ලොට් අංක 2 නම් වූ ඉඩම් කොටස ද, දකුණට : පිඹුරු අංක 4935 හි ලොට් 1A හි තවත් කොටසක් සහ ලොට් 1B ද, බස්නාහිරට : කනත්ත පාර ද, මායිම් වූ පර්චස් විසිපහ (අ.0, රූ. 0, පර්. 25) ක් විශාල ඉඩම සහ ඒ තුළ පිහිටි වරිපනම් අංක 155/61 දරන නිවස සහ ඒ තුළ පිහිටි සියලු දේ ද සමඟ වේ.

මෙය හෝමාගම ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ C 234/54 හි ලියාපදිංචි කර ඇත.

ඉහත කී දේපළ නැවත මැනීමක දී මෙහි පහත පරිදි විස්තර කර ඇත :

බස්නාහිර පළාතේ කොළඹ දිස්ත්‍රික්කයේ හේවාගම් කෝරළේ පල්ලේ පත්තුවේ මහරගම නගර සභා සීමාව තුළ සහ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ අංක 497 රුක්මලේ බටහිර ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ රුක්මලේ යන ගමේ පිහිටි දෙල්ගහවත්ත නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු බී. කේ. එස්. බමුණුසිංහ විසින් 2016.06.09 වන දින මැන සකස් කරන ලද අංක 3548 දරන පිඹුරේ ලොට් A1 දරන කොටසට මායිම් , උතුරට : ආර්. ඒ. ඩී. කරෝලිස් අප්පුහාමිගේ උරුමකරුවන් හිමිකම් කියන දෙල්ගහවත්ත ද, නැගෙනහිරට: පිඹුරු අංක 1171 හි ලොට් අංක 2 නම් වූ මෙම ඉඩමේ කොටස ද, දකුණට : පිඹුරු අංක 4935 හි ලොට් 1A හි තවත් කොටසක් සහ ලොට් 1 B ද බස්නාහිරට : අරලිය පටුමග ද, මායිම් වූ පර්චස් විසිපහ (අ. 0, රූ. 0, පර්. 25) ක් විශාල ඉඩම සහ ඒ තුළ පිහිටි වරිපනම් අංක 155/61 දරන නිවස සහ ඒ තුළ පිහිටි සියලු දේ ද සමඟ වේ.

මෙය හෝමාගම ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ C234/54 හි ලියාපදිංචි කර ඇත.

*දේපළට පිවිසීම.-* කොට්ටාව සිට අතුරුගිරිය මාර්ගයේ අඟහරුවාදා සති පොළ හංදියේ වම් පසට ඇති පාරට හැරී මී. 600ක් පමණ ඉදිරියට යන විට හමුවන හතරමං හංදියෙන් දකුණු පසට ඇති බාලිකා නිවාස පාරට හැරී මී. 600 ක් පමණ ඉදිරියට යන විට දකුණු පසට හමුවන බාලිකා නිවාසයට ඉදිරි පසින් ඇති අරලිය පටුමගට හැරී ඉදිරියට යන විට දකුණු පසට හමුවන දෙවන නිවස වේ.

ආර්. කේ. ගාමිණී වීරසිරි,
අධිකරණ රෙජිස්ට්‍රාර් - 1 නියෝජ්‍ය පිස්කල්,
සාම විනිසුරු (මුළු දිවයිනටම),
වාණිජ මහාධිකරණය,
කොළඹ 12.

වර්ෂ 2021 ක් වූ ඔක්තෝබර් මස 11 වැනි දින,
කොළඹ, වාණිජ මහාධිකරණයේ දී ය.

10-369

# විවිධ දැන්වීම්

## දැන්වීමයි

ස්වකීය සිවිල් අධිකරණ බලය ක්‍රියාත්මක කරමින් කොළඹ දී නඩු විභාග කරන බස්නාහිර පළාත් මහාධිකරණයේ දී ය

රත්මලාන, බොරුපන පාර, සමගි මාවත, අංක 17 හි පිහිටි ඊසී ඩිස්ට්‍රිබියුෂන් (ප්‍රයිවට්) ලිමිටඩ් සම්බන්ධ කාරණාවේ දී ය.

ගණන් බේරා වසා දැමීමේ
ඉල්ලීම් අංක : 73/2021/CO.

*සහ*

2007 අංක 7 දරන සමාගම් පනතේ XII කොටස යටතේ අධිකරණය විසින් ගණන් බේරා වසා දැමීම සඳහා වූ ඉල්ලීමක් පිළිබඳ කාරණයේ දී ය.

ඩීඑෆ්සීසී බැංක් පීඑල්සී,
අංක 73/5,
ගාලු පාර,
කොළඹ 03.

....................*පෙත්සම්කරු.*

කොළඹ දී නඩු විභාග කරන බස්නාහිර පළාතේ මහාධිකරණය විසින් ඉහත නම සඳහන් සමාගම ගණන් බේරා වසා දමනු ලැබීම සඳහා,

ඩීඑෆ්සීසී බැංක් පීඑල්සී,
අංක 73/5,
ගාලු පාර,
කොළඹ 03.

විසින් 2021 සැප්තැම්බර් මස 16 වැනි දින එක අධිකරණය වෙත පෙත්සමක් ඉදිරිපත් කරන ලද බවත්, එකී පෙත්සම, 2021 දෙසැම්බර් මස 13 වන දින එකී අධිකරණය ඉදිරියේ ඇසිය යුතු බවට නියම කර ඇති බවත්, එකී පෙත්සම මත නියෝගයක් කිරීමට සහයෝගය හෝ විරෝධය හෝ දැක්වීමට කැමති එකී සමාගමේ යම් ණය හිමියෙකු හෝ දායකයෙකු එකී පෙත්සම අසන වේලාවේ දී පුද්ගලිකව හෝ අධිනීතිඥ මහතෙකු හෝ ලේඛනගත නීතිඥයෙකු මගින් එම අරමුණ වෙනුවෙන් පෙනී සිටීමට හැකි බව මෙයින් දන්වනු ලැබේ. තව ද, පෙත්සමේ පිටපතක් ඒ සඳහා නියමකර ඇති ගාස්තු ගෙවීම මත එය අවශ්‍ය වන සමාගමේ යම් ණය හිමියෙකුට හෝ දායකයෙකුට පහත අත්සන් කරන අය විසින් සපයනු ලබන්නේ ය.

නීතිඥ තේජක පෙරේරා මහතා,
පෙත්සම්කරුගේ නීතිඥ,
අංක 73, ඩබ්ලිව්. ඒ. ඩී. රාමනායක මාවත,
කොළඹ 02.

***සටහන.***- එකී පෙත්සම ඇසීමේ දී පෙනී සිටීමට අදහස් කරන යම් පුද්ගලයෙකු, එසේ කිරීමට ඇති ඔහුගේ/ඇයගේ/එහි අදහස්, ඉහත නම සඳහන් නීතිඥ තේජක පෙරේරා මහතා යන අය වෙත ලිඛිතව භාරදීම හෝ තැපැල් මගින් එවීම කළ යුතුය. පුද්ගලයින්ගේ නම් සහ ලිපිනය හෝ යම් ව්‍යාපාරයක් නම්, එහි නම සහ ලිපිනය, හෝ ඔහුගේ හෝ ඔවුන්ගේ ලේඛණගත නීතිඥයින් ඇත්නම්, ලේඛනගත නීතිඥවරයාගේ නම සහ ලිපිනය නොතීසියේ සඳහන් කිරීම අවශ්‍ය වන අතර, එය 2021 දෙසැම්බර් මස 11 වැනි දින පස්වරු 1.00ට පෙර, ඉහත නම සඳහන් අයවළුන්ට ලැබෙන සේ, කල් වේලා ඇතිව භාර කිරීම හෝ තැපැල් කරනුයේ නම්, එසේ තැපැල් කිරීම අවශ්‍ය වේ.

නීතිඥ තේජක පෙරේරා මහතා,
පෙත්සම්කරුගේ නීතිඥ.

10-333

## ''ශ්‍රී ලංකා බැප්ටිස්ට් සංගමය'' යන නාමය ''ශ්‍රී ලංකා බැප්ටිස්ට් සභාව'' නමින් සංස්ථාපනය කිරීම සඳහා සංශෝධන පනත් කෙටුම්පතකි

1944 අංක 54 දරන ලංකා බැප්ටිස්ට් සභා ආඥාපනත යටතේ සංස්ථාගත කරන ලද 1991 අංක 14 දරන ශ්‍රී ලංකා බැප්ටිස්ට් සංගමය (සංස්ථාගත කිරීමේ) (සංශෝධන) පනත

හර්ෂ ද සිල්වා වන මම, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 53 යටතේ 1944 අංක 54 දරන ලංකා බැප්ටිස්ට් සභා ආඥාපනත යටතේ සංස්ථාගත කරන ලද 1991 අංක 14 දරන ''ශ්‍රී ලංකා බැප්ටිස්ට් සංගමය'' (සංස්ථාගත කිරීමේ) (සංශෝධන) පනත නැවත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි, යනුවෙන් හැඳින්වෙන පනත් කෙටුම්පතක් පාර්ලිමේන්තුවේ දී ඉදිරිපත් කිරීමට අදහස් කරන බව මෙයින් දන්වා සිටිමි.

පනත් කෙටුම්පතේ අරමුණ වනුයේ එහි සංස්ථාගත නාමය වන ''ශ්‍රී ලංකා බැප්ටිස්ට් සංගමය'' වෙනුවට ''ශ්‍රී ලංකා බැප්ටිස්ට් සභාව'' ලෙස සංශෝධනය කර භාවිතා කිරීමයි :-

හර්ෂ ද සිල්වා,
ශ්‍රී ලංකා පාර්ලිමේන්තු මන්ත්‍රී.

10-354

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.